# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.01.19 පැය 1250 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 106 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වූ කාන්තා අපයෝජනයකට අදාල වීඩියෝපටයකට සැකකරන, සැකකරුවෙකු අත්අඩංගුවට -ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශය.**

පිරිමියෙකු විසින් කාන්තාවක් නිරුවත් කරන ආකාරයේ වීඩියෝපටයක් පසුගිය දිනවල සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වීය. එම සිද්ධිය සම්බන්ධයෙන් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිතුමියගේ උපදෙස් හා නියෝග පරිදි අදාල වින්දිත පාර්ශවයන් හඳුනාගැනීමට ක්‍රියා කර එම කාර්යංශය මඟින් විමර්ශන කටයුතු ආරම්භ කරන ලදී.

ප්‍රධාන සැකකරු 2026.01.18 වන දින හික්කඩුව ප්‍රදේශයේ පිහිටි ප්‍රසිද්ධ හෝටලයක සැඟවී සිටියදී අත්අඩංගුවට ගෙන ඇති අතර වයස අවුරුදු 43 ක් වන ෆෙයාෆීල්ඩ් වත්ත, බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

සැකකරුට ආධාර අනුබල ලබාදුන් හා පොලිසියට සාක්ෂි වසන් කරන ලද අවුරුදු 44 ක් හා 55 ක් වන ඇහැළියගොඩ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන් දෙදෙනෙකු ද අත්අඩංගුවට ගෙන ඇත.

ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වන සැකකරු තම නිවසේ සේවිකාවක් වශයෙන් කටයුතු කරන ලද කාන්තාවක්, පිරිසක් ඉදිරියේ එම නිවසේදී නිරුවත් කර එය වීඩියෝ පටිගත කර වට්ස්ඇප් සමූහයක් ඔස්සේ සමාජ මාධ්‍ය වෙත මුදා හැර ඇති බවට අනාවරණය වී ඇත.

මෙම සැකකරු සම්බන්ධව අළුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර විදේශ ගමන් තහනම් නියෝගයක්ද ලබා ගෙන විමර්ශන සිදු කරගෙන ගොස් ඇති අතර සැකකරු සිද්ධියෙන් පසුව පොලිසිය මඟහරිමින් ප්‍රසිද්ධ හෝටල් කිහිපයක නවාතැන් ගෙන ඇති බවට ද අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**